# මත්ද්‍රව්‍ය භාවිතය සමාජයට ඇතිකරන බලපෑම පිළිබඳ සමාජ භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක් (කිරුළපන පොලිස් බල ප්‍රදේශය ඇසුරින්)

ජී. ඩබ්. පී. ප්‍රසාද් *, ජී.ඒ.ඒ.එන්. ශ්‍රී ශාන්'
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
*gwpprasad@gmail.com

සමාජ භූගෝල විද්‍යාව යනු සමාජ අවකාශය හා ස්ථානය පිළිබඳ විද්‍යාවයි. සමාජය තුළ ඇතිවන්නා වූ විසංවිධානකාරිත්වයන් සමාජ අවකාශයට සිදුකරන බලපෑම මෙම විෂය ක්ෂේත්‍රය තුළින් අධ්‍යයනය කරනු ලබන අතර සමාජ භූගෝල විද්‍යාවේ මූලික පදනම වන්නේ සමාජ අවකාශය යන්නයි. ඒ අනුව සමාජ යථාපැවැත්ම පිළිබඳ භූගෝල විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම මෙහිදී සිදුකරයි. ඒ අනුව කාලයක් ගත වුව ද ස්ථිර විසඳුම් නොලද සමාජ ගැටලුවක් වන මත්ද්‍රව්‍ය භාවිතය සමාජයට ඇතිකරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක් කිරුළපන ප්‍රදේශය ආශ්‍රයෙන් සිදුකර ඇත. මෙහි දී අවධානය යොමුකර ඇති ප්‍රධාන අරමුණ ලෙස කිරුළපන පොලිස් බල ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිතය සමාජයට ඇතිකරන බලපෑම පිළිබඳ පිළිබඳ විමර්ෂණය කිරීමත් සුවිශේෂී අරමුණු ලෙස මත්ද්‍රව්‍ය ව්‍යාප්තියට බලපාන හේතු, මත්ද්‍රව්‍ය සඳහා යොමු වීමට බලපාන කරුණු හඳුනාගැනීම සහ මත්ද්‍රව්‍ය භාවිතය නිසා ඇති වන ගැටලු හඳුනාගැනීම දැක්විය හැකිය. මත්ද්‍රව්‍ය භාවිතය සමාජ ගැටලු සඳහා සහ සමාජ විකාශනයට බලපෑම් කරන්නේ කෙසේ ද යන්න පර්යේෂණ ගැටලුව ලෙස මෙහිදී අධ්‍යයනය කරයි. අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස කිරුළපන පොලිස් බල ප්‍රදේශය මෙහිදී යොදා ගන්නා අතර පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් හා සම්මුඛ සාකච්ඡා තුළින් අවශ්‍ය තොරතුරු ලබාගෙන ඇති අතර ද්විතීයික දත්ත ලෙස කිරුළපන පොලීසියේ පොලිස් වාර්තා මඟින් ලබාගත් තොරතුරු ද මෙම අධ්‍යයනය සඳහා යොදාගෙන ඇත. මෙම පර්යේෂණයට අනුව මත්ද්‍රව්‍ය භාවිතය සමාජ ප්‍රශ්නයක් වී ඇති අතර මත්ද්‍රව්‍ය මඟින් ව්‍යාජ ආත්ම විශ්වාසයක් ජනිත කරවන අතර පවුලත්, සමාජයත් අතර බැඳුණු සාරධර්ම හා සමාජමය ගුණධර්ම ඉක්මවා යා හැකි ව්‍යාජ නිදහසක් ද ඇති බව මෙම පර්යේෂණය තුළින් තහවුරු විය. මත්පැන් හේතුවෙන් කෙනෙකුගේ සැලසුම් කිරීමේ හැකියාවත්, ගැටලු විසඳීමේ හැකියාවත් පහත බසින අතර, ආත්ම සෝදිසිය ඌණනය වෙයි. දරුවන් කෙළෙසීම්, ස්වාමි භාර්යා ගැටලු යනාදී ප්‍රශ්න බීමත්කමත් සමඟ ශීඝ්‍රයෙන් ඉහළ යයි. මත්ද්‍රව්‍ය වඩාත් සුලබ වීම, ප්‍රචාරණය, සමාජ ආර්ථික සාධක, සංක්‍රමණය, ආගම සහ සදාචාරයේ වෙනස්වීම්, දේශපාලන සහය, පොලිස් නිලධාරීන්ගේ අඩු අවධානය හා කාර්යක්ෂමතාවේ අඩු ලුහුඬුකම් යනාදිය මේ සඳහා වැඩි වශයෙන් බලපා ඇත. ප්‍රදේශයේ වැඩි ප්‍රවණතාවයක් ඇති මත්ද්‍රව්‍ය හා සම්බන්ධ අපරාධ වන්නේ හෙරොයින් සහ ගංජා ළඟ තබා ගැනීම වන අතර කිරුළපන පොලිස් බල ප්‍රදේශය තුළ අනෙක් අපරාධවලට සාපේක්ෂව මත්ද්‍රව්‍ය දුර්භාවිතය ඉහළ ප්‍රතිශතයක් ගනියි. පාසල් දරුවන් ඉලක්ක කර මත්ද්‍රව්‍ය විකිණීම ද මෙම පර්යේෂණය තුළින් හඳුනා ගන්නා ලද ප්‍රවණතාවකි.

**ප්‍රමුඛ පද**: අපරාධ; ඇබ්බැහි වීම; මත්ද්‍රව්‍ය; සමාජ ප්‍රශ්න